දර කෝටුවකට වඩා දරමිටිය ශක්තිමත් බව තේරුම් ගමු...

# ඥාණසාර හිමියන්ගේ බෝගම්බර ප්‍රකාශය මෙන්න...!

අස්ගිරි පාර්ශවයේ ලේඛකාධිකාරි ආචාර්ය මැදගම ධම්මානන්ද හිමියෝ පවසති.



සමන්ති වීරසේකර

සිංහල ජාතිය වැනසී යෑමට පෙර සිංහල පාර්ලිමේන්තුවක් ඇති කිරීම අපගේ එකම අපේක්ෂාවයි. සිංහල නායකයකු සමග සිංහල පාර්ලිමේන්තුවක් පිහිටුවීමේ නායකත්වය සදහා මේ රටේ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රමුඛ සංඝරත්නය පෙරමුණ ගත යුතුයි... ශ්‍රී ලංකාවේ පන්සල් දහ දහසක් තිබෙනවා. එක් පන්සලකින් ඡුන්දදායකයන් දහසක් බැගින් සංවිධානය කර ගතහොත් සිංහල පාර්ලිමේන්තුවක් නිර්මාණය කර ගැනීම දුෂ්කර කාර්යයක් නොවෙයි. ප්‍රජාතන්ත්‍රවාදයේ මහගෙදර මේ රටේ පාර්ලිමේන්තුවයි. මේ රට සිංහලයන්ගේ රටයි.

දෙදහස් පන්සිය අවුරුද්දක් මේ රටේ සිංහල සංස්කෘතියක් පැවතුණා. සිංහලයන්ට තිබෙන්නේ මේ රට පමණයි. දහහතර ලක්ෂයක් සුළු ජාතිකයන්ගේ ඡුන්ද දෙස බලාගෙන කටයුතු නොකරන ලෙස මේ රටේ නායකයන්ට අපි කියනවා. දෙසිය විසිපහක් මන්ත්‍රිවරු පාර්ලිමේන්තුවේ සිටින වා. දෙසිය විසිපස් දෙනාගෙන් චෝදනාවක් නැති එක මන්ත්‍රීවරයෙක් ඉන්නවාද? මහජන නියෝජිතයන් ලෙස ජනතාව පාර්ලිමේන්තුවේ ඉන්දවන ජනතා නියෝජිතයා වංක නම් රටම අගාධයකට යන බව අමුතුවෙන් කිවයුතු නැහැ...

ඉකුත් ජුලි හත් වැනිදා සවස මහනුවර බෝගම්බරදී පැවැත්වුණු 'මුළු දැයම එක රොදටී සමුළුවේදී බොදුබල සේනා සංවිධානයේ නායක ගලගොඩඅත්තේ ඥානසාර හිමියෝ එසේ පැවසූහ.

මේ සමගම අස්ගිරිය, මල්වත්ත, රාමක්ඥ්ක්ඥ සහ අමරපුර ඇතුළු නිකායන්හි සංඝයා වහන්සේලා විවිධ අදහස් දැක්වූහ. සියලුම බෞද්ධ බලවේග එක රොදකට එක්කාසු විය යුතු බවත්, එසේ නොවන තාක් සිදුවන්නේ සෝද සෝදා මඩේ දමන ක්‍රමවේදයක් බවත් උන්වහන්සේලා කියා සිටියහ.

ඒ අතුරින් අස්ගිරි පාර්ශ්වයේ ලේඛකාධිකාරි ආචාර්ය මැදගම ධම්මානන්ද හිමියෝ මෙසේ ප්‍රකාශ කළහ.

''අපට පෙනෙන අන්දමට කවුරු කොයි අන්දමට ප්‍රතිපත්ති මාලා ගෙන ආවත්, යෝජනා ගෙන ආවත් ඡුන්දයක් ආසන්න වෙත්ම මේවා පෞද්ගලික අභිලාෂ උදෙසා විතැන්වීමක් දක්නට ලැබෙනවා. ප්‍රතිපත්ති මාලා දේශනමාලා විය යුතු නැහැ. ඇතැම් සංඝයා වහන්සේලා විවිධ දේශපාලන මතිමතාන්තර සහ බැඳීම් අනුව ඒ ඒ අංශ වෙත බැඳීම් ඇති කරගන්න බවක් පෙනෙනවා.

අපි පොදුවේ එක මතයකට පැමිණීම දැන් රටේ ජනතාවගේ අවශ්‍යතාවය වී තිබෙනවා. දැන් ගලගොඩඅත්තේ ඥානසාර හිමියෝ ජනතාව අතරට පැමිණ සිටිනවා. උන් වහන්සේ මේ සමස්ත සංඝරත්නය සමග එකට එක මතයට පැමිණ කටයුතු කරන බව දැන් ප්‍රකාශ කළ යුතුයි. ත්‍රෛනිකායික මහානායක ස්වාමීන් වහන්සේලා ඇතුළු මහා සංඝරත්නය රටේ යහපත උදෙසා කැපව සිටින බැවින් බොදුබල සේනාව ද එම මතයන් හා එක්ව තමන්ගේ දැක්ම රටට ගෙන යන බව දැන් පිළිගත යුතු කාලය එළැඹ තිබෙනවා. මේ සමස්ත බොදු බලවේගයන්හි ශක්තිය රටට තේරුම් ගත හැකි වන්නේ එවිටයි.

වෙන් වෙන් වශයෙන් ගමන යන බවක් පෙන්නුවහොත් ජනතාව අතර වැරදි මතයක් පැතිර යනවා. ඒවා වළක්වන්න බැහැ. සංවිධාන සියල්ල සමග එක්ව කටයුතු කරන බවට පොදු මතයක් ඇති කිරීම හරහා පොදු කතිකාවක් ඇතිවනවා. පොදු කටයුතු එක්ව එකට යමින් දැන් කටයුතු කළ යුතුයි. පොදු ප්‍රතිපත්තියක් සමග ඉදිරියට යෑම ජාතික වශයෙන් බලවේග සියල්ල කැටි කොට තැබිය යුතුයි.

දේශපාලනික හෝ නිකායික හෝ හිතෛෂීභාවයන් අනුව දැන් කටයුතු කරන්න බැහැ. රට ගැන සිතමින් පොදු මතය තමයි අතිශය වැදගත්. අපි එකට එකතු වෙමු කියන මතය සමස්ත බොදු බලවේග සියල්ල අතරම මේ වන විට ප්‍රචලිත වී තිබෙනවා. බොදුබල සේනාවේ ප්‍රතිපත්ති සහ යෝජනාවලිය ද සෙසු යෝජනාද එක්කරමින් ඉදිරි මැතිවරණ අපේක්ෂකයින් පසෙකලමින් අපි අපේ ගමන යා යුතුව තිබෙනවා'' යැයි මැදගම ධම්මානන්ද නායක හිමියෝ ප්‍රකාශ කළහ.

සිංහල රාජ්‍යක් උදෙසා ''දැයම එක රොදකට'' ජාතික න්‍යායපත්‍රයක් සඳහා කරනු ලබන යෝජනාවලිය තැනූ බොදුබල සේනාව එම යෝජනාවලිය මහනුවර දළදා මැඳුරට පෙරහැරින් රැගෙන ආහ. ජීවමාන බුදුන්වහන්සේ ලෙස ලෝ දනන්ගේ ගෞරව බහුමානයට පාත්‍ර වන වන්දනීය දන්ත ධාතුන් වහන්සේ වැඩ සිටින ගන්ධ කුටිය ඉදිරිපස හිඳ යෝජනාවලිය මල් අසුන මත තබා එක් හඬින් කියවා, ඊට ශක්තිය ලබා දුන මැනවැයි අයැදමින් බුදුන් වහන්සේට එය භාර කළහ. එම යෝජනාවලිය මෙසේය.

### 1) අපේ සිංහල රාජ්‍ය නැවත ප්‍රතිස්ථාපනය කිරීම

1815 දී සිංහලේ රාජ්‍ය හා ඉංග්‍රීසින් විසින් මහනුවර දී අත්සන් කළ ගිවිසුමට අනුව අපෙන් උදුරාගත් අපේ සියලු උරුමයන් දිනා ගැනීම පිණිස එහි පදනම වන සිංහල රාජ්‍ය ස්ථාපිත කොට අන් සියලු ව්‍යුහයන් ඒ මත ශක්තිමත්ව ප්‍රතිනිර්මාණය කළ යුතුය. බුද්ධ ශාසනය ආරක්ෂා කොට පෝෂණය කිරීම රජයේ වගකීම වන අතර අනෙකුත් ආගම් ඇදහීමේ අයිතිය මානව අයිතිවාසිකමක් ලෙස පිළිගනු ලැබේ.

ඓතිහාසිකව රටේ ශිෂ්ටාචාරය නිර්මාණය කළ සිංහලයන් ''භූමිපුත්‍රයන'' ලෙස නිර්වචනය කෙරේ.

සිංහල භාෂාව කතා කරන සියලු ජන කොටස් එක්කර ශක්තිමත්ව එක් ජාතියක් ගොඩනැඟීමට යෝජනා කරන අතර, අදහන ආගම අනුව ජාතීන් වෙන් කිරීම නවතා දැමීමට යෝජනා කරමු. ඒ අනුව සිංහල බෞද්ධයින්, සිංහල කිතුනුවන්, සිංහල ඉස්ලාම් භක්තිකයින්, සිංහල හින්දු භක්තිකයින් ලෙස විවිධ ආගම් අදහන ජන කාණ්ඩ හඳුනාගනු ඇත. අපේ සිංහල රාජ්‍ය ඔවුන් සියලු දෙනාගේම මව්බිම වනු ඇත.

### 2) එක් රටක්, එක් ජාතියක් , එක් නීතියක්

අප ජාතිය වෙත බලෙන් පැටවූ රෝම, ලන්දේසි, ඉංග්‍රීසි ආකෘතීන් තුළින් නිර්මාණය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීති රීති පද්ධතිය වෙනුවට අපගේ අනන්‍යතාවය සුරකින අපේ ජාතික අවශ්‍යතා නියෝජනය කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සහ නීතිරීති පද්ධතියක් අලුතෙන් සකස් කිරීමට මෙයින් යෝජනා කරනු ලැබේ.

ඒ අනුව විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණ පද්ධතිය, රාජ්‍යපරිපාලනය, නීති පද්ධතිය යන සියලු ව්‍යුහයන් පුළුල් ලෙස ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කෙරේ.

එක් එක් ආගමික කණ්ඩායම් හෝ ජනවර්ග පදනම් කරගෙන විවිධ වාර්ගික හා ආගමික නීති රීති ක්‍රියාත්මක කිරීම වහා නවත්වා දැමීමට කටයුතු කළ යුතු අතර සියලු පුරවැසියන් සිය ජාතිය හෝ ආගමික පදනමෙන් බැහැරව පොදු නීති රීති පද්ධතියකට අනුගත විය යුතුය. රටේ බහුතර ජනතාව නියෝජනය නිරූපණය කිරීමට අසමත් වර්තමාන සමානුපාතික ඡුන්ද ක්‍රමය වෙනුවට සැබෑ ජනමතය නියෝජනය කරන්නා වූ නව මැතිවරණ හා ඡුන්ද ක්‍රමයක් මෙයින් යෝජනා කෙරේ.

ආගමික හා ජනවාර්ගික පදනම යටතේ ක්‍රියාත්මක වන සියලු දේශපාලන පක්ෂ තහනම් කළ යුතුය.

### 3) බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම

දැනටමත් අප රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති බුද්ධ ශාසනය සුරක්ෂිත කර පෝෂණය කිරීම සඳහා වන රජයේ වගකීම් බලාත්මක කිරීමට කඩිනම් පියවර ගැනීම අපගේ පළමු උත්සාහයයි.

බුද්ධ ශාසනය සුරක්ෂිත කිරීම උදෙසා රජයේ වගකීම් පිළිබඳ පැහැදිලි නිර්වචනයක් නොමැති වීමෙන් මෙම වගකීම් පැහැර හරින බව පැහැදිලිවම පෙනෙතත් ඒ සම්බන්ධයෙන් පියවරක් ගැනීමට ගරුතර මහා සංඝරත්නයට හෝ සිවිවනක් පිරිසේ වෙනත් සාමාජිකයින්ට නොහැකි වී ඇත.

අප වෙනුවෙන් අලුතෙන් ව්‍යවස්ථාවක් ගොඩනඟා ගන්නා තුරු පවතින ව්‍යවස්ථාවෙන් ලබාගත හැකි උපරිම ආරක්ෂාව බුද්ධ ශාසනය වෙනුවෙන් ලබා ගැනීමට අප කටයුතු කළ යුතුය. වෙනත් විවිධ ආගම් සඳහා රජයේ වියදමෙන් අමාත්‍යංශ සහ අනෙකුත් ආයතන බිහිකර නඩත්තු කිරීම්, වෙනත් ආගම් ප්‍රවර්ධනය කිරීමට රාජ්‍යසම්පත් යෙදවීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බුද්ධ ශාසනය වෙනුවෙන් ලබාදී ඇති ආරක්ෂාව හා සෘජුව ගැටෙන හෙයින් රාජ්‍යවගකීම් පැහැදිලිව නිර්වචනය කොට බුද්ධ ශාසනය සුරක්ෂිත කිරීම වෙනුවෙන් රාජ්‍ය මැදිහත්වීම් ශක්තිමත් කළ යුතුයි.

විවිධ අන්තවාදී ආගමික කණ්ඩායම්වල ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම රාජ්‍යේ වගකීම් ලෙස අවධාරණය කොට තහවුරු කළ යුතුය. එම වගකීම් ඉටු කිරීම සඳහා ශක්තිමත් රාජ්‍යයාන්ත්‍රණයක් බිහි කරගත යුතුය.

### 4) ජාතික ආරක්ෂාව

අපගේ රටත්, ජාතියත්, සම්බුද්ධ ශාසනයත් අනේකවිධ සතුරු බලවේගවල නිරන්තර ඉලක්කයක් බවට පත්ව ඇත්තේ ජාතියේ අවාසනාව නිසා නොව භූ දේශපාලනික වැදගත්කමත්, අපගේ ස්වභාවික සම්පත්වල ආර්ථික වටිනාකමත්, අප ගොඩනැගූ ශිෂ්ටාචාරයේ ඓතිහාසික වැදගත්කමත් නිසාමය.

වරෙක වර්ගවාදී, බෙදුම්වාදී බලවේගවල ගොදුරක්ව තිස් වසරක යුද්ධයක පැටලුනු අප රට දැන් ආගම් වාදී සමාජ බෙදුම්වාදයකත්, ආගමික ත්‍රස්තවාදයකත් දඩබිමක් බවට පත්ව ඇත. තවත් පසෙකින් අන්‍යාගමිකරණ කුමන්ත්‍රණකරුවන් රට තුළ ආගමික සංහිඳියාව බිඳ දමමින් සිටී.

මේ සියලු දුෂ්ට බලවේගයන් පරාජය කළ හැකි වන්නේ වර්ගවාදී බෙදුම්වාදය පරාජය කළා හා සේම ''ජාතියම එක් රොදකට'' එක්ව මෙම දුෂ්ට බලවේග හා සටන් කිරීම තුළින් ය.

වර්ගවාදී බෙදුම්වාදය තහනම් කළා සේ ම ආගමික බෙදුම්වාදයත් ආගමික අන්තවාදයත් වහා තහනම් කිරීම්ට කටයුතු කළ යුතුය. වෙනම නීතිරීති, බැංකු ක්‍රම, උසාවි හරහා වෙනම සංස්කෘතික රාජ්‍යන් ගොඩනඟන්නට උත්සාහ කිරීම ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන බැවින් එය